# උතුරු මැද පළාත් සභා පාසල්වල පුරප්පාඩු සඳහා විදුහල්පති ශ්‍රේණිධාරින් තෝරාපත්කර ගැනීමේ සම්මුඛ පරීක්ෂණ ලකුණු පටිපාටිය

ක්‍රියාත්මක වන දිනය : මෙම පටිපාටිය ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

උතුරු මැද පළාත් පාසල් පද්ධතිය තුළ වඩාත් ගුණාත්මක අධ්‍යාපන ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා, පද්ධතිය තුළ ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කරන විදුහල්පති ශ්‍රේණිධාරීන්ට වඩාත් සුදුසු පාසලක් ලබා දීමත් ඒ ඒ පාසල් සඳහා වඩාත්ම සුදුසු විදුහල්පතිවරුන් පත් කිරීම තුළින් පාසල් පද්ධතිය වඩාත් කාර්යක්ෂම කිරීමත් අරමුණු කර ගනිමින් උතුරු මැද පළාත් අධ්‍යාපන ප්‍රඥාප්තියට අනුකූලව මෙම පටිපාටිය සකස් කර ඇත.

ඉහත මූලික අරමුණු ඉටු කර ගැනිම පිණිස උතුරු මැද පළාත් සභාවට අයත් පාසල්වල සහකාර විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති හා විදුහල්පතිවරු, විදුහල්පති තනතුරුවල ඇතිවන පුරප්පාඩු සඳහා විදුහල්පති ශ්‍රේණිධාරින් තෝරා ගැනීමේ දී පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කළ යුතු වේ.

**01. පුරප්පාඩු වාර්තා කිරීම ප්‍රසිද්ධ කිරීම හා තෝරා ගැනීමේ ක්‍රමවේදය.**

**1.1** ඒ ඒ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් තම කලාපවල ඉදිරි මාස 06ක කාලය තුළ ඇති වීමට නියමිත සහකාර විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති හා විදුහල්පතිවරුන්, විදුහල්පති තනතුරු පුරප්පාඩු සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වනි දිනට හා ජූනි 30 දිනට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් පළාත් අධ්‍යාපන ලේකම් වෙත යොමු කළ යුතු ය. එම ලේඛනය අනුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් එම පුරප්පාඩු දෙසැම්බර් 31 හා ජූනි 30 දිනට කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මඟින් ප්‍රසිද්ධ කර ජනවාරි 21 දිනට හා ජුලි 21 දිනට පෙර අයදුම්පත් කැඳවිය යුතු අතර, මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සම්පූර්ණ කරන ලද සියලු අයදුම්පත්‍ර ජනවාරි 21 දිනට හා ජුලි 21 දිනට හෝ එදිනට පෙර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන ලේකම් වෙත යොමු කළ යුතු ය. සියලු අයදුම් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු අතර එහි පිටපතක් මාර්ගගත ක්‍රමයට ද ඉදිරිපත් කළ යුතු ය. සහතිකවල පිටපත් එවීම අවශ්‍ය නොවන අතර, එම සහතිකවල මුල් පිටපත් සියල්ල සම්මුඛ පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කළ යුතු ය. පසුව ඉදිරිපත් කරන සහතික පත් සැලකිල්ලට ගනු නොලැබේ. ඒ අනුව අයදුම් පත් කැඳවන අවසන් දිනයෙන් ඉදිරි දින 10 ක් තුළ සම්මුඛ පරීක්ෂණය පවත්වා ඉදිරි මාස 6 තුළ පුරප්පාඩු වීමට නියමිත විදුහල්පති තනතුරු සඳහා සුදුසුකම්ලත් අයගේ ප්‍රමුඛතා ලේඛනය සකස් කළ යුතු ය. ජනවාරි හා ජුලි මාස තුළ සිදු වීමට නියමිත පුරප්පාඩු සඳහා සුදුස්සන් තෝරාගැනිම ඊට පෙර පවත්වන සම්මුඛ පරීක්ෂණ මඟින් සිදුකළ යුතු ය.

**1.2** විශ්‍රාම යාම මත ඇති වන පුරප්පාඩුවලට අමතරව මිය යාම, වෙනත් පළාත් සඳහා ස්ථාන මාරු වී යාම හෝ එවැනි වෙනත් හදිසි හේතු මත ඇතිවන පුරප්පාඩු, එම පුරප්පාඩු ඇති වූ විගස පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා වෙත දැන්විය යුතුය.

**02. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය.**

- **I.** පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්
- **II.** පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
- **III.** වෙනත් පළාත් අමාත්‍යාංශයක හෝ රාජ්‍ය සේවයේ වෙනත් මාණ්ඩලික නිලධාරියෙක්

**03. ලකුණු ලබා දීමේ ක්‍රමවේදය :**

පහත සඳහන් ක්‍රමවේදයට අනුව ලකුණු ලබා දීම සිදු කළ යුතුයි.

**I.** අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම්.

**(අ)** සහ (ආ) යටතේ ලබා ඇති ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ.

**(අ)** අධ්‍යාපන සුදුසුකම් (උපරිම ලකුණු 10)

| | | |
|---|---|---|
| පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පශ්චාත් උපාධිය හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් | - | ලකුණු 10 |
| ප්‍රථම උපාධිය | - | ලකුණු 07 |
| අ.පො.ස. (උ.පෙළ) | - | ලකුණු 04 |
| අ.පො.ස. (සා.පෙළ) | - | ලකුණු 03 |

**(ආ)** වෘත්තිය සුදුසුකම් (උපරිම ලකුණු 10)

| | | |
|---|---|---|
| අධ්‍යාපනපති උපාධිය (MED) / පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා(PGDEM) | - | ලකුණු 10 |
| පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව (PGDE) | - | ලකුණු 07 |
| පාසල් කළමනාකරණ ඩිප්ලෝමාව (DSM) | - | ලකුණු 05 |
| ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය/ගුරු පුහුණු සහතිකය | - | ලකුණු 04 |

(ඇ) මේ යටතේ පහත සඳහන් සුදුසුකම් ලබා ඇත්නම් **(1)** (අ) යටතේ ලබාගන්නා ලකුණු වලට අමතරව පහත සඳහන් ලකුණු ප්‍රමාණය හිමි වේ. මෙම සුදුසුකම් සඳහා (3).1 (අ) යටතේ ලකුණු ලබාදෙනු නොලැබේ. මේ යටතේ ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

**ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම**

| | | |
|---|---|---|
| 1. | ඉංග්‍රීසි උපාධි (උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා ඇත්නම්) | ලකුණු 10 |
| 2. | ඉංග්‍රීසි ඩිප්ලෝමාවක් හෝ උපාධියට විෂයක් ලෙස හදාරා ඇත්නම් | ලකුණු 06 |
| 3. | අ.පො.ස. උසස් පෙළ හෝ සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි සමත් | ලකුණු 04 |
| 4. | තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ රජය විසින් පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 6 කට වැඩි සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. | ලකුණු 02 |

**තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම**

| | | |
|---|---|---|
| 1. | තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිය | ලකුණු 08 |
| 2. | තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවක් | ලකුණු 06 |
| 3. | අ.පො.ස උසස් පෙළ හෝ සාමාන්‍ය පෙළ තොරතුරු තාක්ෂණය සමත් | ලකුණු 04 |
| 4. | තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ රජය විසින් පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 6 කට වැඩි සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. | ලකුණු 02 |

**දෙවන භාෂාව පිළිබඳ දැනුම**

| | | |
|---|---|---|
| 1. | දෙවන භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා | ලකුණු 08 |
| 2. | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂා පාඨමාලාවක් අ.පො.ස උසස් පෙළ හෝ සාමාන්‍ය පෙළ දෙවන භාෂාව සමත් | ලකුණු 06 |
| 3. | දෙවන භාෂා සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. | ලකුණු 04 |

**(ඇ)** රාජ්‍ය සේවයේ ලබා ඇති විදේශීය පුහුණු (දින 2 ක් හෝ ඊට වැඩි) ලකුණු 04

ආසන්න වසර 03 ක කාලය තුළ දී ලබා ඇති විදේශ පුහුණු මේ සඳහා සලකා බලනු ලැබේ. එක් පුහුණුවක් සඳහා එක් ලකුණක් බැගින් උපරිම අවස්ථා දෙකක් සඳහා ලකුණු ලබාදිය යුතු යි.

**II.** පාසලේ විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා ලබා දී ඇති දායකත්වය. (උපරිම ලකුණු 10)

විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා ලකුණු ලබා දීමේ දී වසර 03 ක විභාග ප්‍රතිඵල ඇගයීම සඳහා භාජනය කෙරේ. වසර 03 හි ප්‍රතිඵලවල සමත් ප්‍රතිශතයෙහි සාමාන්‍ය අගය සලකා ලකුණු ලබාදීම සිදු කරනු ලැබේ. ප්‍රාථමික අංශය පමණක් සහිත පාසල්, ද්විතීක අංශය පමණක් සහිත පාසල් හා අංශ දෙකම ඇති පාසල් පවතින බැවින් (අ) හෝ (ආ) යන දෙකෙන් එකක් යටතේ පමණක් ලකුණු ලබා දේ.

**(අ)** 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය (උපරිම ලකුණු 10)

මෙම එක් එක් ලකුණු සීමාවේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව පාසලේ පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 50 % ඉක්මවයි නම් පමණක් අදාළ ලකුණු ප්‍රමාණය පිරිනැමිය යුතු යි.

ඒ ඒ වර්ෂයේ සමත් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශ විසින් ලබා දී ඇති කඩඉම් ලකුණු සංඛ්‍යාවට සාපේක්ෂව සමත් ප්‍රතිශතය,

| | |
|---|---|
| 80%ට ඉහළ | ලකුණු 10 |
| 70% - 79%ත් අතර | ලකුණු 08 |
| 60% - 69%ත් අතර | ලකුණු 06 |
| 50% - 59%ත් අතර | ලකුණු 04 |
| 40% - 49%ත්අතර | ලකුණු 02 |

**(ආ)** අ.පො.ස.(සා.පෙළ) විභාගය (උපරිම ලකුණු 10)

ගණිතය, මව්බස යන විෂයයන් සහිතව විෂයයන් 6 ක් සමඟ සම්මාන 03ක් ලබා සමත්වීමේ ප්‍රතිශතය මෙහිදි සලකා බලනු ලැබේ.

| | | |
|---|---|---|
| 80%ට ඉහළ | - | ලකුණු 10 |
| 70% - 79% අතර | - | ලකුණු 08 |
| 60% - 69% අතර | - | ලකුණු 06 |
| 50% - 59% අතර | - | ලකුණු 04 |
| 40% - 49% අතර | - | ලකුණු 02 |

**III.** විෂය බාහිර/ විෂය සමගාමී ජයග්‍රහණ සඳහා ලබා දී ඇති දායකත්වය (උපරිම ලකුණු 10)

අදාළ අයදුම්කරුගේ නායකත්වය යටතේ පාසල සඳහා අත්කර දී ඇති සුවිශේෂ ජයග්‍රහණ සලකා බලා මෙම ලකුණු ප්‍රදානය කළ යුතු වේ. ආසන්න වසර 03 ක කාලය තුළ ලබා ඇති සෞන්දර්ය, ක්‍රීඩා සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලත් වෙනත් විෂය සමගාමී ජයග්‍රහණ සලකා බැලිය යුතු අතර, මෙම ජයග්‍රහණය අධ්‍යාපන අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව හෝ රජයේ අමාත්‍යාංශයක්/ දෙපාර්තමේන්තුවක් හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිළිගත් ආයතනයක් මඟින් මෙහෙයවන අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව සහභාගි වන තරඟාවලියක දී ලද ජයග්‍රහණයක් විය යුතු ය.

මෙම ලකුණු ප්‍රදානය කිරීමේ දී එක් ඉසව්වක් සඳහා ලබා ඇති උපරිම ජයග්‍රහණය සඳහා එක් මට්ටමක දී පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. විවිධ ජයග්‍රහණ සඳහා උපරිම ලකුණු 10 ට යටත් ව ලකුණු උපයා ගත හැකි වේ.

| | | |
|---|---|---|
| ජාත්‍යන්තර ජයග්‍රහණ | - | ලකුණු 10 |
| ජාත්‍යාන්තර නියෝජනය | - | ලකුණු 06 |
| ජාතික/ සමස්ත ලංකා ජයග්‍රහණ | - | ලකුණු 04 |
| පළාත් ජයග්‍රහණ | - | ලකුණු 03 |
| කලාප ජයග්‍රහණ | - | ලකුණු 02 |

**IV.** විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් පද්ධතිය වෙත අත්කර දී ඇති නිර්මාණශීලී ප්‍රතිඵල (උපරිම ලකුණු 10)

තම විදුහල්පති සේවා කාලය තුළ ක්‍රියාත්මක කර ඇති විශේෂ වැඩසටහන්/ ව්‍යාපෘති සඳහා මෙම ලකුණු ලබා දෙනු ලැබේ. අයදුම්කරු විසින් ම ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කළ යුතු අතර, මෙම ව්‍යාපෘති අදාළ විෂය භාර අධ්‍යක්ෂ/ කොට්ඨාස අධ්‍යක්ෂ/ කලාප අධ්‍යක්ෂ හෝ අදාළ බලධාරියා විසින් අනුමත කර තිබිය යුතු යි.

එක් විශේෂ ව්‍යාපෘතියක්/ වැඩසටහනක් සඳහා ලකුණු 1 බැගින් උපරිම ලකුණු 10 කි.

- ප්‍රතිඵල සංවර්ධනය/ විෂය සංවර්ධන සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්
- ඌන සම්පත් කළමනාකරණය/ භෞතික සම්පත් වර්ධනය සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්
- මානව සම්පත් සංවර්ධනය/ ප්‍රජාවේ සුබ සිද්ධිය සඳහා ක්‍රියාත්මක කර ඇති සුවිශේෂ වැඩසටහන්
- පරිසර වැඩසටහන්/ සාමාජීය වැඩසටහන්
- බාලදක්ෂ/ ශිෂ්‍යභට හෝ වෙනත් විශේෂ නිර්මාණශීලී ක්‍රියාකාරකම්

**V.** සේවය සඳහා ලබා ඇති ඇගයීම්. (උපරිම ලකුණු 10)

විදුහල්පති සේවා කාලය තුළ දී ලබා ඇති සේවා ඇගයීම් සඳහා ලකුණු ප්‍රදානය කළ යුතුය. උපරිම ලකුණු 10ට යටත්ව ඉහළම ඇගයීම් අවස්ථාව සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| ගුරු විදුහල්පති ප්‍රතිභා ප්‍රණාම/ ජාතික මට්ටමේ ඇගයීම් | - | ලකුණු 10 |
| විශිෂ්ට ව්‍යවහාර ජාතික මට්ටමේ ඇගයීම් | - | ලකුණු 07 |
| විශිෂ්ට ව්‍යවහාර පළාත් මට්ටමේ ඇගයීම් | - | ලකුණු05 |
| පැනසර තක්සලාව ඇගයීම්/ පළාත් මට්ටමේ ඇගයීම් | - | ලකුණු03 |

VI. ප්‍රශංසා සහ දෝෂ දර්ශන

පොදු 230 බී ආකෘතියේ ලබා දී ඇති එක් සේවා ප්‍රශංසාවක් සඳහා ලකුණු 02 බැගින් (උපරිම ලකුණු 06 කි.)

නියමිත ආකෘතියෙන් ලබාදී ඇති එක් දෝෂ දර්ශනයක් සඳහා ලකුණු 02 බැගින් අඩු කරනු ලැබේ.

VII. පසුගිය වසර 3 තුළ ලබා නොගත් නිවාඩු සඳහා පහත පරිදි ලකුණු ලබාදෙනු ලැබේ. අනියම්/ විවේක නිවාඩු වල එකතුවෙන්, (උපරිම ලකුණු 06)

| | | |
|---|---|---|
| ❖ ලබා නොගත් නිවාඩු | 80% හෝ ඊට වැඩි | ලකුණු 06 |
| | 50% / 79% | ලකුණු 04 |
| | 25% / 49% | ලකුණු 02 |
| | 25% අඩු | ලකුණු 01 |

VIII. ජ්‍යෙෂ්ඨතාවය (උපරිම ලකුණු 20)

විදුහල්පති සේවයේ සේවා කාලය වසර 1 කට ලකුණු 2 බැගින් උපරිම කාලය වසර 10 ක් සඳහා ලකුණු ලබාදිය යුතු යි.

පුරප්පාඩු සහිත පාසල සඳහා අනුමත විදුහල්පති ශ්‍රේණියට අදාළව මෙම ලකුණු ප්‍රදානය කළ යුතු යි. එහි දී ජ්‍යෙෂ්ඨතාවය සඳහා හිමි ලකුණු ප්‍රදානය කරනු ලබන්නේ අයදුම්කරු තමා අයදුම් කරන පාසලට අනුමත විදුහල්පති ශ්‍රේණිධාරියෙකු නම් පමණි.

(උදා 1AB පාසලක් සඳහා අයදුම්කරන විදුහල්පතිවරුන්ට ජ්‍යෙෂ්ඨතාවයට හිමි ලකුණු ලබා දිය යුතු වන්නේ විදුහල්පති 1 ශ්‍රේණියේ සේවා කාලය සම්පූර්ණ කර ඇති වසර ගණන (උපරිම වසර 5) සඳහා පමණි. 11 හා 111 ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් ද අයදුම් කර ඇත්නම් මෙම ලකුණු හිමි නොවේ).

IX. පාසල් පද්ධතියට බලපාන වෙනත් සේවාවන් (මුළු ලකුණු 06)

- අධිකාරීලත් නිලතල (ශිෂ්‍යභට,බාලදක්ෂ) - ලකුණු 02
- විනිසුරු/ පුහුණුකරු සහතික (අධ්‍යාපන අමාත්‍යාංශය අනුමත පාසල් ක්‍රීඩා) - ලකුණු 02
- රචනා කර ඇති පොත්, සඟරා, ශාස්ත්‍රීය ලිපි( 02 ක් හෝ ඊට වැඩි) - ලකුණු 02

**X.** සෑම අයදුම්කරුවකු විසින් ම තමා පත්වීමට නියමිත තනතුරට අදාළව අධ්‍යාපන/ භෞතික හා මානව සම්පත් සංවර්ධනය උදෙසා ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට අදහස් කරන ව්‍යාපෘති/ යෝජනා සම්බන්ධව මිනිත්තු 05 ක ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු ය. (සිදුකරන ලද ව්‍යාපෘතිය සම්බන්ධව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තහවුරු කර තිබිය යුතු යි). - ලකුණු 05

**XI.** සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව සඳහා - ලකුණු 05

**04.** **පොදු කරුණු**

I. ආසන්න වසර 5 ක තුළ අවවාද කිරීම් හැර වෙනත් විනය දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

II. ආසන්න වසර 5 ක තුළ සක්‍රීය හා සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර එම වසර 5 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.

III. මෙම තනතුරු සඳහා අයදුම් කළ හැක්කේ උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නියුතු විදුහල්පති සේවයේ අයට පමණි.

**05.** **නියෝජ්‍ය විදුහල්පති සහ සහකාර විදුහල්පති තනතුරු දරණ අයදුම්කරුවන් සඳහා ලකුණු ලබා දීම.**

මෙම පටිපාටියට අනුව නියෝජ්‍ය විදුහල්පති සහ සහකාර විදුහල්පති තනතුරු දරණ අයදුම්කරුවන් සඳහා ලකුණු ලබා දීමේ දී II, III හා IV සඳහා හිමි සම්පූර්ණ ලකුණු වලින් 75% ක ප්‍රතිශතයක් පමණක් ලබා දෙනු ලැබේ. තවද නියෝජ්‍ය/ සහකාර විදුහල්පතිවරයකු ඊට පෙර විදුහල්පති තනතුරක් දැරූ වේ නම්, එම කාල සීමාවට අදාළව වසර 03 ක කාලය සඳහා ඉහත 11,111,1V යටතේ සම්පූර්ණ ලකුණු ලබාගැනීමට හිමිකම ඇත. එහි දී නියෝජ්‍ය/ සහකාර විදුහල්පති කාල සීමාවට අදාළව ලකුණු ලබාගැනීමට හිමිකමක් නැත. කෙසේ වෙතත් විදුහල්පති ධුරයේ කාල සීමාව වසර 03 කට අඩු වන අවස්ථාවක දී නියෝජ්‍ය/ සහකාර විදුහල්පති ධුරයට අදාළව අනුපාතිකව ලකුණු ලබාගත හැකි ය.

**06.** **අදාළ සුදුසුකම් සහිත අයදුම්කරුවන් ඉදිරිපත් නොවූ අවස්ථාවක ගන්නා ක්‍රියාමාර්ග.**

1. යම් පුරප්පාඩු සහිත පාසලක් සඳහා අදාළ ශ්‍රේණියට අනුව සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොමැති නම්, ඊළඟ ශ්‍රේණියේ අයදුම්කරුවන්ගෙන් එම පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.
2. යම් පාසලක් සඳහා කිසිදු අයදුම්කරුවෙකු ඉදිරිපත් නොවන අවස්ථාවක දී කාර්ය සාධනය සැලකිල්ලට ගෙන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය මත පළාත් අධ්‍යාපන ලේකම් විසින් සුදුසු විදුහල්පතිවරයෙකු ස්ථාන ගත කරනු ලැබේ.

**විශේෂ කරුණු**

ලකුණු පටිපාටිය අනුව ලකුණු ලබාදීම හා සමගාමීව පහත සඳහන් පරිදි පාසලක සිටින ශිෂ්‍ය සංඛ්‍යාව පදනම්කර ගනිමින් පාසලකට පත් කළ යුතු විදුහල්පතිවරයාගේ ශ්‍රේණිය තීරණය කරනු ලබයි.

| පාසල් කාණ්ඩය | විදුහල්පතිවරයාගේ ශ්‍රේණිය |
|---|---|
| 1AB | ශ්‍රී ලං.වි.සේ. 1 |
| 1C | ශ්‍රී ලං.වි.සේ. 11 |
| 2 හා 3 | ශ්‍රී ලං.වි.සේ. 111 |

- සිසුන් 1000 කට වැඩි ප්‍රාථමික පාසල් සඳහා 1 ශ්‍රේණියේ හෝ 11 ශ්‍රේණියේ විදුහල්පතිවරයකු ද පත් කළ හැකිය.
- එක් එක් පාසල් සඳහා අනුමත ශ්‍රේණියේ විදුහල්පතිවරු පමණක් පත්කරනු ලැබේ.
- යම් පාසලක් සඳහා අනුමත ශ්‍රේණියකට වඩා ඉහළ ශ්‍රේණියක විදුහල්පතිවරයෙකු වැඩිම ලකුණු ලබා ඇත්නම් එම නිලධාරියා විදුහල්පති ලෙස පත්කරනු ලැබේ.
- යම් පාසලක් සඳහා අනුමත ශ්‍රේණියක හෝ ඊට ඉහළ ශ්‍රේණියක විදුහල්පතිවරුන් ඉල්ලුම්කර නොමැති අවස්ථාවල අනුමත ශ්‍රේණියට පහළ ශ්‍රේණියේ විදුහල්පතිවරුන්ගෙන් ලකුණු ලබාගත් නිලධාරියා වැඩබලන පදනමින් විදුහල්පති ලෙස පත් කරනු ලැබේ.
- සියලුම කාණ්ඩවල විදුහල්පති තනතුර සඳහා ඕනෑම ශ්‍රේණියක විදුහල්පතිවරුන්ට අයදුම් කළ හැකි අතර, අදාළ සේවයේ විදුහල්පතිවරුන් එම පුරප්පාඩු සඳහා අයදුම්කර ඇති අවස්ථාවක එම ශ්‍රේණියේ අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ඇත. නො එසේ නම් පමණක් ඊට පහළ ශ්‍රේණියේ අය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර වැඩිම ලකුණු ලබාගන්නා අය විදුහල්පති ලෙස වැඩ බලන පදනමින් පත් කරනු ඇත.
- අධිසේවක පදනම යටතේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයට පත්වීම් ලැබ ඇති නිලධාරීන් සඳහා විදුහල්පතිවරු පත්කිරීමේ පටිපාටිය යටතේවන පත්කිරීම් සඳහා සලකා නොබැලේ.
- තම සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කිරීමට අපේක්ෂිත ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු අතර පසුව කරන ඉල්ලීම් පිළිබඳ සලකා බලනු නොලැබේ.